සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **ඉතිහාසය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3) සහ (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දි ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. පහත සන්දේශ කාව්‍ය අතරින් පැරණිතම සන්දේශ කාව්‍ය වන්නේ,
    1. ගිරා සන්දේශයයි
    2. මයුර සන්දේශයයි
    3. සැලළිහිණි සන්දේශයයි.
    4. හංස සන්දේශයයි

02. ලංකා පුරාවෘතය රචනා කරන ලද පිලිප්පස් බැල්ඩියස් කුමන ජාතිකයෙක් ද?
    1. අරාබි
    2. පෘතුගිසි
    3. ඕලන්ද
    4. ඉංග්‍රීසි

03. තඹ තහඩුවක් මත රචනා කර ඇති ප්‍රසිද්ධ අභිලේඛනය කුමක් ද?
    1. පනාකඩුව සන්නස
    2. හෝපිටිගම ලිපිය
    3. අඹගමුව ලිපිය
    4. වල්ලිපුරම් සන්නස

04. දීපවංශය රචනා කිරීමට පදනම් වූ මූලාශ්‍රයක් වන්නේ මින් කුමක් ද?
    1. මහාවංශය
    2. රාජාවලිය
    3. නිකාය සංග්‍රහය
    4. උත්තර විහාරට්ඨ කතා

05. අතීත ඇඳුම් පැළඳුම්, ආභරණ, කොණ්ඩා මොස්තර හා රූපලාවන්‍ය කටයුතු පිළිබඳ සොයා බැලීමේ දී වඩා වැදගත් වන මූලාශ්‍රය වර්ගය කුමක් ද?
    1. නටඹුන්
    2. අභිලේඛන
    3. චිත්‍ර
    4. පුරාවස්තු

06. පැරණි සෙල්ලිපිවල දැකිය හැකි ඉර හඳ, වටාපොත, දුන්න, ඊතලය, හක්ගෙඩිය හා ගොන් කුරය ආදී සලකුණුවලින්,
    1. සදාකාලික බව නිරූපණය වේ.
    2. රාජකීය බව නිරූපණය වේ.
    3. පැරණි ප්‍රාදේශීය මායිම් නිරූපණය වේ.
    4. නිදන් වස්තු පිළිබඳ තොරතුරු නිරූපණය වේ.

07. මුල් යකඩ යුගය ලෙස හඳුන්වනු ලබන කාල වකවානුව හඳුන්වන නම කුමක් ද?
    1. ප්ලයිස්ටොසීන යුගය
    2. හොලෝසීන යුගය
    3. ප්‍රාග් ඓතිහාසික ගල් යුගය
    4. පූර්ව ඓතිහාසික යුගය

08. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ බෙල්ලන්බැදිපැලැස්ස,
    1. වියලි කලාපීය එළිමහන් වාසස්ථානයකි.
    2. තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයකි.
    3. වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරකි.
    4. තෙත් කාලාපීය ලෙන් ජනාවාසයකි.

09. කිතුල්ගල බෙලිලෙන කැනීම් වලින් හමු වූ කළපු බෙල්ලන්ගේ අවශේෂවලින් අනාවරණය වන වඩාත් වැදගත්ම කරුණ කුමක් ද?
    1. ගල් යුගයේ ප්‍රජාව බහුල වශයෙන් බෙල්ලන් ආහාරයට ගත් බව
    2. ගල් යුගයේ මිනිසුන් ආහාර සඳහා ලුණු එක් කර ගත් බව
    3. රට මැද සිට මුහුද දක්වාම සංචාරය කළ බව
    4. ආභරණ තැනීම සඳහා බෙලි කටු යොදා ගත් බව

10. මධ්‍යශිලා යුගයට අයත් ජ්‍යාමිතික හැඩයෙන් යුත් ගල් මෙවලම් තනා ගැනීම සඳහා බහුල ලෙස භාවිත කර ඇති පාෂාණ වර්ගය කුමක් ද?

1. තිරිවානා ගල් 2. කහඳ ගල් 3. ගුරු ගල් 4. කළුගල්

11. පහත I තීරුවේ ශ්‍රී ලංකාව ජනාවාස වීම සම්බන්ධයෙන් ස්ථාන කීපයක් දැක්වේ. II තීරුවේ එම ස්ථාන හා සම්බන්ධ තොරතුරු කිහිපයක් දක්වා ඇත. I තීරුවේ අනුපිළිවෙළ අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. සීගිරිය<br>2. කිතුල් ගල බෙලි ලෙන<br>3. පතිරාජවෙල | A. පුලුස්සන ලද කැලෑදෙල් ඇට<br>B. ඉරණමඩු සැකැස්ම<br>C. පහතරට වියළි කලාපීය ලෙන් |

1. AB හා C 2. BC හා A 3. BA හා C 4. CA හා B

12. අයිස් යුගය අවසන් වී ලෝකය උණුසුම් වීමත් සමඟ කෘෂිකර්මාන්තය සඳහා උචිත පරිසරයක් නිර්මාණ වූයේ,

1. හොලෝසීන යුගයේ දී ය. 2. ප්ලයිස්ටොසීන යුගයේ දී ය.
3. ගල් යුගයේ දී ය. 4. පූර්ව ඓතිහාසික යුගයේ දී ය.

13. උඩරංචාමඩම නේවාසික ප්‍රදේශයෙන් හමු වූ වර්ණ කරන ලද මැටි බඳුනට සමාන මැටි බඳුනක් හමු වූ පැරණි ජනාවාස කුමක් ද?

1. බෙරගල 2. පොතාන 3. අලිගල 4. හල්දුම්මුල්ල

14. ගමත්, පුරයත් අතර ජනාවාස අතීත ජනයා විසින් හඳුන්වන ලද්දේ කෙසේ ද?

1. ගම 2. නකර 3. පුර 4. නුරුපුර

15. දසගම් මණ්ඩලය නම් පරිපාලන සංවිධානයක් පිළිබඳ තොරතුරු සඳහන් සෙල්ලිපිය පිහිටි ප්‍රදේශය කුමක් ද?

1. ඇඹුල්අඹේ 2. කළුදියපොකුණ 3. සීගිරිය 4. කණ්ඩලම

16. සමන්තපාසාදිකාව නම් කෘතිය රචනා කරන ලද්දේ,

1. පාහියන් හිමියන් විසින් ය. 2. හියුං සියැන් හිමියන් විසින් ය.
3. බුද්ධඝෝෂ හිමියන් විසින් ය. 4. මහානාම හිමියන් විසින් ය.

17. සිතුල්පව්ව කොරවක්ගල ප්‍රදේශයේ පිහිටි සෙල්ලිපියේ සඳහන් වන්නේ,

1. ගමිකවරුන් පිළිබඳව ය. 2. පරුමක වරුන් පිළිබඳව ය.
3. ගෘහපතිවරුන් පිළිබඳව ය. 4. ප්‍රාදේශීය රජවරුන් පිළිබඳව ය.

18. පහත A, B, C හා D යටතේ දැක්වෙන සිදුවීම්, ඒවා සිදු වූ කාලානු පිළිවෙළට ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

A. වරිච්චි බිත්ති බැඳ වටකරු හැඩයේ නිවාස ඉදි කිරීම
B. කළුගල් භාවිතයෙන් මෙවලම් තනා ගැනීම
C. වැව් පද්ධති ඉදි කිරීම
D. ක්ෂුද්‍ර ශිලා මෙවලම් තනා ගැනීම

1. ABCD 2. BCDA 3. BDAC 4. CBDA

19. පැරණි ශ්‍රී ලංකාවේ පළමු අගනගරය කුමක් ද?

1. තම්බපණ්ණි 2. උපතිස්සගාමය 3. පොළොන්නරුව 4. අනුරාධපුරය

20. ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛා දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීමෙන් දේවානම්පියතිස්ස රජතුමා අපේක්ෂා කළේ,

1. ප්‍රාදේශීය රාජ්‍යයන් සමඟ සුහදතාව ඇති කර ගැනීමයි.
2. ඉන්දියාව සමඟ තිබූ සුහදත්වය රැක ගැනීමයි.
3. අශෝක රජුට තම අවනතභාවට ප්‍රකාශ කිරීමයි.
4. ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධ වීමයි.

21. පහත A සිට D දක්වා දී ඇති සිදුවීම් අතරින් වසභ රජතුමා සම්බන්ධ තොරතුරු පමණක් අඩංගු පිළිතුර කුමක් ද?
   A. ශ්‍රී ලංකාව ආස්ථානවලට බෙදා පාලනය කිරීම
   B. චෝළයින්ගෙන් රජරට ප්‍රදේශය නිදහස් කර ගැනීම
   C. රෝමාණුක දේශය සමඟ දූත සබඳතා පැවැත්වීම
   D. වංකනාසිකතිස්ස රජුගෙන් පසු රජ බවට පත් වීම

   1. A හා D  2. B හා C  3. B හා D  4. C හා D

22. ධනයට අධිපති දෙවියන් වූ කුවේරයන්ගේ වාසභවන කුමක් ද?

   1. සීගිරිය  2. සුභ පබ්බත  3. ගෝවින්දමලය  4. ආලකමන්දාව

23. කාලිංග වංශික තිලෝක සුන්දරි කුමරිය අගබිසව කරගත්තේ,

   1. මහා පරාක්‍රමබාහු රජු විසිනි.
   2. මහා විජයබාහු රජු විසිනි.
   3. නිශ්ශංකමල්ල රජතුමා විසිනි
   4. දෙවන පරාක්‍රමබාහු රජු විසිනි

24. වී වගා කරන ලද කුඩා බිම් ප්‍රමාණය අතීතයේ දී හඳුන්වා ඇත්තේ,

   1. කෙත නමිනි.  2. ක්ෂේත්‍රය නමිනි  3. කුඹුර නමිනි.  4. කෙටු කණබ නමිනි.

◆ **පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරෙන් 25 සිට 27 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
   A. ලම්භකර්ණ වංශයට අයත් පාලකයෙකු වීම.
   B. දළදා මාලිගයේ ආරක්ෂාව සඳහා වේලෙක්කාර හමුදාව යෙදවීම.
   C. කාලිංග චක්‍රවර්තී ස්වාමීන් වහන්සේ නමින් හැඳින් වීම.
   D. චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගී වීම.
   E. හේන් වගාවෙන් අය කරන ලද බදු වර්ග දෙකක් අහෝසි කිරීම.
   F. මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමාරයෙකුට විවාහ කර දීම.

25. පළමු විජයබාහු රජතුමා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

   1. A හා D  2. B හා D  3. B හා F  4. C හා E

26. නිශ්ශංකමල්ල රජතුමා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

   1. A හා C  2. B හා C  3. B හා D  4. C හා E

27. පළමු ගජබාහු රජතුමා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

   1. A හා D  2. B හා D  3. B හා F  4. C හා E

28. ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩම කරවන ලද්දේ,

   1. ලංකාපටුන වරායෙනි.
   2. දඹකොළපටුන වරායෙනි.
   3. ගෝකණ්ණ වරායෙනි.
   4. මහාතිත්ථ වරායෙනි.

29. **පහත වගුවේ I තීරුවේ දී භාවිත වූ ව්‍යවහාර කිහිපයක් දැක්වෙන අතර II තීරුවේ එම ව්‍යවහාරයන්ගේ අර්ථ නිරූපණයන් දක්වා ඇත I තීරුවට අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.**

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. අන්තේවාසික<br>2. සද්ධිවිහාරිය<br>3. භාණකවරු | A. නායක ස්වාමීන් වහන්සේ යටතේ වාසය කරන භික්ෂූන් වහන්සේලා<br>B. ධර්මය කොටස් කට පාඩමින් පවත්වාගෙන ගිය භික්ෂූන් වහන්සේලා<br>C. නායක තෙරුන් යටතේ වාසය කරන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා |

1. AB හා C  2. AC හා B  3. BC හා A  4. CB හා A

30. පැරණි සෙල් ලිපිවල සඳහන් කර ඇති ''අඩික'' නම් නිලධාරියාගේ කාර්යභාරය කුමක් ද?
1. ගම් වැව් ඉදිකිරීම  2. පාලම් ඉදි කිරීම
3. ඇළ මාර්ග ඉදි කිරීම  4. මහ වැව් ඉදිකිරීම

31. ක්‍රිස්තු පූර්ව 2400 කාල නිර්ණය කළ යබොර කැබැල්ලක් හමු වූ ප්‍රදේශය කුමක් ද?
1. දඹුල්ල  2. අභයගිරිය  3. සීගිරිය  4. බෙරගල

◆ **පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ /පද යුගල අධ්‍යයනය කර 32 සිට 34 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. අකුණු සන්නායක
2. ස්ථිති විද්‍යුතය

B - 1. සුළං ධාරා
2. මයිනහම

C - 1. කුඩීන්
2. වෛද්‍යවරුන්

D - 1. අතිරේක ධාන්‍ය ප්‍රමාණයක් නිෂ්පාදනය
2. නිෂ්පාදන අතිරික්තය

32. පළමුවැන්න හා දෙවැන්න අතර සබඳතාවයක් නොදක්වන ප්‍රකාශ / පද යුගලය කුමක් ද?
1. A  2. B  3. C  4. D

33. පළමුවැන්න ඇති වීමට දෙවැන්න උපකාරීවන බව දැක්වෙන ප්‍රකාශ / පද යුගලය කුමක් ද?
1. A  2. B  3. C  4. D

34. පළමුවැන්න නිසා දෙවැන්න ඇති වන බව දැක්වෙන ප්‍රකාශ / පද යුගලය කුමක් ද?
1. A  2. B  3. C  4. D

35. පැරණි සමාජයේ ජනතාව අතර නීති නියාමනය කරනු ලැබුවේ,
1. ආරක්ෂක නිලධාරීන් විසිනි.  2. රජතුමා විසිනි.
3. ගම් නායකයින් විසිනි.  4. ඇමතිවරුන් විසිනි

36. සිතුල්පව්ව ප්‍රදේශයේ පිහිටි මහා විනිශ්චය ශාලාවකින් ලැබූ දඩ මුදල් සිතුල් පව්ව විහාරයේ භික්ෂූන් වහන්සේලාට සිව්පස ලබා ගැනීමට පරිත්‍යාග කළ පාලකයා කවුරුන් ද?
1. හය වන අග්ගබෝධි  2. පළමුවන ගජබාහු
3. භාතිකාභය  4. දුටුගැමුණු

37. ලංකාවේ භාවිත වූ පැරණිතම කාසි වර්ගය සාහිත්‍ය කෘතිවල හඳුන්වා ඇත්තේ කෙසේ ද?
1. කහාපන  2. හස්ඵබු කාසි  3. කහවණු  4. පුරාණ

◆ **පහත දැක්වෙන A හා B යටතේ ඇති තොරතුරු ඇසුරෙන් 38 හා 39 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - බ්‍රාහ්මණයාගම සෙල් ලිපියේ පරුමකලු සමනා නම් කාන්තාවක් ගැන සඳහන් වීම

B - උඩරංචාමඩම නිවසේ කැනීම්වල දී රතු හා කහ පැහැති ගුරුගල් හමුවීම

38. අතීත ජන සමාජයේ කාන්තාවට උසස් තැනක් හිමි ව තිබීම සම්බන්ධයෙන්,
1. A හා B සත්‍ය වේ.  2. A හා B අසත්‍ය වේ.
3. A සත්‍ය වන අතර B අසත්‍ය වේ.  4. A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

39. අතීත කාන්තාව රූප අලංකරණය පිළිබඳ උනන්දුවෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන්,
1. A හා B සත්‍ය වේ.  2. A හා B අසත්‍ය වේ.
3. A සත්‍ය වන අතර B අසත්‍ය වේ.  4. A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

40. නිශ්ශංකමල්ල රජුට පසු පොළොන්නරුවේ රජ බවට පත් වූ එතුමාගේ සහෝදරියගේ පුත්‍රයා කවුරුන්ද?
1. සහාස්සමල්ල  2. චෝඩගංග  3. වීරබාහු  4. පරාක්‍රම පාණ්ඩ්‍ය

Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**

**Second Term Test - 2025**

| 10 ශ්‍රේණිය | ඉතිහාසය - II | කාලය පැය 03 යි |
|---|---|---|

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි

- I කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න 5 ක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01\. අ) (i) දී ඇති ලංකා සිතියමේ පහත ස්ථාන සියල්ල ම ලකුණු කර නම් කරන්න.

අනුරාධපුරය, ඉරණමඩුව වැව, අලිමංකඩ, මාගම, සීගිරිය, ගෝකණ්ණතිත්ථ, කතරගම, කලා වැව, කෝට්ටේ, දැදුරු ඔය, ලංකා පටුන, මාදුරු ඔය (ලකුණු 12 යි)

(ii) දී ඇති ලෝක සිතියම් කොටසෙහි පහත ස්ථාන සියල්ල ම ලකුණු කර නම් කරන්න.

පෘතුගාලය, රෝමය, රතු මුහුද, කැලිකට්, සුමාත්‍රා දූපත, කොරියානු අර්ධද්වීපය (ලකුණු 06 යි)

ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය නම් දේශාටන වාර්තාවේ කතුවරයා කවුරුන් ද?

B - රෝමානුක දේශයට දූතයන් යවා වීදුරු පබලු ගෙන්වාගත් රජතුමා කවුරුන් ද?

C - පොළොන්නරුව මුලින් ම ලංකාවේ අගනගරය කරගත් පාලකයා කවුරුන් ද?

D - පනාකඩුව තඹ සන්නසේ සඳහන් ආරක්ෂක නිලධාරියා කවුරුන් ද? (ලකුණු 04 යි)

◆ A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. A රූපයෙන් දැක්වෙන නිර්මාණය හඳුනාගෙන නම් කරන්න.

2\. එය පිහිටි ආගමික ස්ථානය කුමක් ද?

3\. මෙම නිර්මාණය කුමන රාජධානි සමයකට අයත් ද?

4\. එම නිර්මාණයන් නිරූපණය වන්නේ කවුරුන් ද?

(ලකුණු 04 යි)



A

(iii) 1. B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

2. එය හමු වූ ස්ථානය කුමක් ද?

3. එය කුමන යුගයකට අයත් ද?

4. මේවා භාවිත කර ඇත්තේ කවුරුන් විසින් ද?

(ලකුණු 04 යි)

B



## II කොටස

02. i. අතීත ශ්‍රී ලංකාවේ භාවිත වූ කාසි වර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

ii. සෙල් ලිපි රචනා කිරීමට පදනම් වූ හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

iii. ඉතිහාසය හැදෑරීමේ දී පුරා විද්‍යාත්මක මූලාශ්‍රයවල වැදගත් කම කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

03. i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ තෙත් කලාපීයට ලෙන් වාසස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

ii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අවමංගල අභිචාර විධි **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

iii. පූර්ව ඓතිහාසික යුගයත් ප්‍රාග් ඓතිහාසික යුගයත් අතර පැවති වෙනස්කම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපයේ ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

04. i. පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A. වැඩි දෙනෙකුගේ එකඟතාවයෙන් පාලන අයිතිය ලබා ගත් පුද්ගලයා හඳුන්වන නම

B. ''තොටබොජක'' නම් පරුමක වරයෙක් පිළිබඳ තොරතුරු සඳහන් සෙල් ලිපිය

C. දේවානම්පියතිස්ස රජතුමාට පංච කකුධ භාණ්ඩ එවූ විදේශීය පාලකයා (ලකුණු 03 යි)

ii. වැව් පද්ධති ඉදි කිරීමේ අරමුණු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

iii. අතීත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ රාජ්‍ය උරුම වූ සම්ප්‍රදායන් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. දුටුගැමුණු රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

05. i. ඕනෑම රටක පාලනය මෙහෙයවන ආයතන **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

ii. පුරාණ කාලයේ මෙරට පැවති පාලනයේ අරමුණු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

iii. පුරාණ ශ්‍රී ලංකාවේ පැවති ආර්ථිකයේ ප්‍රධාන අංග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

iv. අතීත ජනයා වාර්ගික සහජීවනයෙන් යුතුව ජීවත් වූ බව උදාහරණ **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

06. i. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. ජ්‍යාමිතික ශිලා මෙවලම් තනා ගැනීමේ තාක්ෂණය හඳුන්වන නම

B. ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසුන් පැල්පත් තනාගෙන ජීවත් වූ බවට සාධක හමුවන ස්ථානය

C. මැටි බඳුන් නිපදවීමට යොදාගත් සරල උපකරණය (ලකුණු 03 යි)

ii. උඩරංචාමඩම නිවසෙහි දැකිය හැකි ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

iii. මහවැව් ඉදිකිරීමේ අරමුණු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. පැරණි වැව්වල දැකිය හැකි තාක්ෂණික අංග **තුනක** ක්‍රියාකාරීත්වය හා ඉදිකිරීමේ ශිල්ප ක්‍රම විස්තර කරන්න. (ලකුණු 06 යි)

07. i. අනුරාධපුර නගරයට ආසන්නව පිහිටි විශාල දාගැබ් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

ii. පුරාණ ශ්‍රී ලංකාවේ යකඩ නිශ්සාරණ තාක්ෂණය පිළිබඳ සාධක හමුවන ප්‍රදේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

iii. අතීත සමාජයේ දේශීය වත් සිරිත් ක්‍රියාත්මක වූ ආකාර **දෙක** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. පැරණි රජවරුන් නීතිරීති ක්‍රියාත්මක කළ ක්ෂේත්‍ර **තුනක්** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

08. i. පැරණි සමාජයේ ප්‍රභූන් ලෙස කටයුතු කළ සමාජ කණ්ඩායම් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

ii. අතීත සමාජයේ සිටි පාලකයන් බදු අය කරන ලද ක්ෂේත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

iii. අතීත සමාජයේ නීතිය හා සම්ප්‍රදාය ක්‍රියාත්මක වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. අතීත කාන්තාවට සමාජයේ උසස් තැනක් හිමිව තිබූ බව කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

09. i. ශ්‍රී ලංකාවේ මුල් ම රාජධානි තුන පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03 යි)

ii. මූලික ගම්මානවල ජීවත් වූවන්ගේ සාමකාමී සහජීවනය බිඳ වැටීමට බලපෑ හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

iii. පොළොන්නරුව ලංකාවේ අගනගරය ලෙස තෝරා ගැනීමට බලපෑ හේතු **දෙකක්** පහදන්න. (ලකුණු 05 යි)

iv. පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(01) (ඇ) (i)
(01) (*a*) (i)
(01) (**m**) (i)



(01) (අ) (ii)
(01) (*a*) (ii)
(01) (**m**) (ii)



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(1) | 4 -(4) | 5 -(3) | 6 -(3) | 7 -(4) | 8 -(2) | 9 -(2) | 10 -(1) |
| 11 -(4) | 12 -(1) | 13 -(4) | 14 -(2) | 15 -(2) | 16 -(3) | 17 -(1) | 18 -(3) | 19 -(4) | 20 -(1) |
| 21 -(1) | 22 -(4) | 23 -(2) | 24 -(3) | 25 -(3) | 26 -(4) | 27 -(1) | 28 -(2) | 29 -(2) | 30 -(3) |
| 31 -(4) | 32 -(3) | 33 -(2) | 34 -(4) | 35 -(1) | 36 -(2) | 37 -(3) | 38 -(1) | 39 -(4) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (අ) (i) නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.

(ii) නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.









සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

01. ආ) i. A - පාහියන්
B - හාතිකාභය
C - පළමු වන විජයබාහු රජතුමා
D - බුද්ධ රාජ / සිත්තරැබිම් බුදල්නා

ii. 1. අශ්ව හිස හා මිනිස්රුව 2. ඉසුරුමුණිය
3. අනුරාධපුරය 4. වැස්සට අධිපත් දෙවියන් වන අග්නි හා පර්ජන්‍ය

iii. 1. පබළු මාලය 2. ඉබ්බන්කටුව සුසාන භූමිය
3. පූර්ව ඓතිහාසික යුගයට 4. රම යුගයේ සිටි ප්‍රභූන් විසින්

02. i. කහාපණ (කහවණු / පුරාණ / ධරණ / හස්ළුබු කාසි / කහවණු) ලක්ෂ්මී, මස්ස, ඇතා හා ස්වස්තිකය වැනි

ii. විහාරාරාමවලට ගම්බිම් පිදීම
- විහාරාරාම පාලනය
- රජයේ නීති මහජනයාට දැනුම් දීම
- බදු අය කිරීම
- වෙළෙඳාම
- වැරදිකරුවන්ට සමාව දීම
- පුද්ගලයන්ගේ සේවය ඇගයීම වැනි

iii. - පුරා විද්‍යාත්මක මූලාශ්‍රයවල තොරතුරු සිදුවීම්වලට සමකාලීන වීම නිසා විශ්වාසනීය තොරතුරු ලබාගත හැකි වීම.
- අතීතය පිළිබඳව දේශපාලන, ආගමික සමාජ, සංස්කෘතික හා ආර්ථික වැනි අංශ පිළිබඳව තොරතුරු ලබා ගත හැකි වීම
- සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් නොවන තොරතුරු අනාවරණය කරගත හැකි වීම
- සාහිත්‍ය මූලාශ්‍රයවල අඩුපාඩු පුරණය කරගත හැකි වීම
- සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් තොරතුරු සනාථ කර ගැනීමට සාක්ෂි වශයෙන් යොදාගත හැකි වීම.

iv. - අතීත අත්දැකීම මගින් වර්තමාන ජීවිතය සාර්ථක කර ගත හැකි වීම
- අනාගත ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කළ හැකි වීම
- තමා ජීවත් වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය
- අතීත අත්දැකීම මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩ නැගීම
- රටේ ජාතක අනන්‍යතාව හඳුනාගැනීම
- මනුෂ්‍යත්වයට ආදරය කිරීමෙන් ජාතික සමගිය ගොඩනැගීම
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු වීම
- විවිධ මත ඉවසීමට හුරු වීම

03. i. පාහියංගල / මානියන්ගම / බටදොඹලෙන / බෙලිලෙන වැනි

ii. * මළ සිරුර ගල්ලෙන තුළ නවා වකුටු කර වළ දැමීම ඇට සැකිලිවල ගුරුගල් ආලේප කිරීම
* මළ සිරුර එහි කොටස් දිරා යන තුරු යම් තැනක වළලා දමා පසුව ඇටසැකිලි ගොඩ ගෙන නැවත ඒවා තැන්පත් කිරීම
* හිස් කබලේ රළුවට පිහිටා තිබුණු දාර සහ පිටතට නෙරා තිබෙන කොටස් ගලක උලා මට්ටම් කර එක් පැත්තක රතු පැහැති ගුරුගල් ආලේප කිරීම
* හිස් කබල දෙකට බෙදෙන සේ සිදුරු විදීම

iii. - පිලිස්සූ මැටි වළං භාවිතය ආරම්භ කිරීම
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධියක් අනුගමනය කිරීම
- යකඩ මෙවලම් භාවිතය ආරම්භ කිරීම
- ස්ථිරවාසිතාවය
- නිවාස ඉදිකිරීම් වැනි

iv. ගංගා නිම්නයට පිටතින් ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගැනීම. (ගංවතුර පාලනය කිරීම පිළිබඳ දැනුමක් නොමැති වීම නිසා)
* කුඩා ගම් වැවක් කේන්ද්‍ර කරගෙන පිහිටා තිබීම (ආහාර නිෂ්පාදනයට වර්ෂා ජලය ප්‍රමාණයත් නොවීම නිසා වර්ෂා ජලය ගබඩා කර ගැනීම සඳහා ගම් වැව් ඉදි කිරීම / සුමන වාපී / විහාර වාපී / හුන්දරිවාපී)
* ගම්මාන එකිනෙක ස්වාධීනව පිහිටා තිබීම (පටු කැළෑ තීරයකින් වෙන් වීම)
* වෘත්තීන් හා කාර්යයන් පදනම් කරගෙන බිහි වූ ගම්මාන පිහිටා තිබීම
(කසීකාරගාම - ගොවියන් විසූ ගම / මණිකාරගාම - මැණික් ගැරූ හෝ මැණික් කැපූ අය ජීවත් වූ ගම් / ගෝපාලගාම / ගොපල්ලන් විසූ ගම් / කේවට්ටගාම - ධීවරයින් විසූ ගම් / කුම්භකාරගාම - වළං සානන්නන් විසූ ගම් / වඩඪකීගාම - වඩුවන් විසූ ගම් / පට්ටනගාම - වරාය ආශ්‍රිත ව තිබූ ගම් / නියම්ගම් - වෙළෙඳ ගම් ඔළගම් - ජනතාව විසින් අතහැර දැමූ වැව් ගම්)
* ක්‍රමවත් පරිපාලන සැලැස්මක් පැවතීම - ගෘශපති / ගමික / දසගම් ඇත්තන්

PAST PAPERS WIKI

04. i. A. මහා සම්මත B. කණ්ඩලම කෙත්ගල් කන්ද C. ධර්මාශෝක රජතුමා
ii. ජල සංරක්ෂණය, පසේ තෙතමනය ඉහළ දමා භෝග වගාව දියුණු කිරීම
iii. - සහෝදරයාගෙන් සහෝදරයාට (වැඩි මහල් සහෝදරයාගෙන් බාල සහෝදරයාට)
- පියාගෙන් පසු පුතාට (අග බිසවගේ වැඩිමහල් පුතාට)
- බිසවගේ සොයුරාට (නායක්කර් සම්ප්‍රදාය - මහනුවර යුගය)
- රජුගේ සොයුරියගේ පුත්‍රයාට (ගම්පොළ යුගය)
iv. * ලංකාව එක්සේසත් කිරීම
* රාජ්‍යතාන්ත්‍රික බව
* ජනතාව කෙරෙහි දැක් වූ සහනශීලී ප්‍රතිපත්තිය
* ආගමික අනුග්‍රහය

05. i. ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය
ii. - රටවැසියා අතර සාමකාමී සහජීවනයක් ඇති කිරීම
- රට වැසියාගේ සුභසාධනය සැලසීම
- මව් බිමේ සුරක්ෂිතතාව සහ රට වැසියාගේ අනාගත චිරජීවනය උදෙසා භූමියේ අඛණ්ඩත්වය ආරක්ෂා කිරීම
iii. ගොවිතැන, සත්ත්ව පාලනය, කර්මාන්ත, වෙළෙඳාම යන අංශවලින් දෙකක් විස්තර කර තිබීම (පෙළ පොත පිටු අංක 47 -53)
iv. * අතීතයේ පැරණි නගරවල විවිධ සංස්කෘතීන්ට අයත් ජනතාව වාසය කළ බවට සාක්ෂි හමු වීම.
(දකුණු ඉන්දියාවෙන් මෙහි පැමිණි දෙමළ වෙළෙන්දෝ, ග්‍රීක් සහමැසිඩෝනියන් ප්‍රදේශවලින් පැමිණි අයෝනියන්වරු, ඇෆ්ගනිස්ථාන් ප්‍රදේශයෙන් පැමිණි කාම්බෝජවරු, මලයානු අර්ධ ද්වීපයෙන් පැමිණි ජාවකවරු)
* ජාතීන් අතර කොපමණ විවිධත්වයක් පැවතිය ද කවර අවස්ථාවක දීවත් ඔවුන් එකිනෙකා සමග කෝලාහල කර ගැනීමට උත්සාහ දරා නැති බව
(බුද්ධ ශාසනයේ පැවිදි ව සිටි දෙමළ ජාතික භික්ෂූන් වහන්සේ කෙනෙකු ගැන අනුරාධපුරයේ අභයගිරි විහාරයෙන් සොයා ගන්නා ලද සෙල් ලිපියක සඳහන් වීම)
* අන්‍ය ජාතීන් දෙස සැක මුසු ලෙස දකින්නට පුරාණ කාලයේ මෙරට වැසියන් පුරුදු වී සිටියේ නැති බව හා අන්‍ය ජාතීන් සමග සුහද ලෙස ජීවත් වීමට ඔවුහු කටයුතු කළ බව
(දෙමළ ජාතික පුරුෂයෙකු සමග විවාහ වූ සිංහල කාන්තාවක ගැන අම්පාර දිස්ත්‍රික්කයෙන් සොයා ගන්නා ලද ඉතා පැරණි සෙල් ලිපියක සඳහන්ව තිබීම)
* මෙරට රාජසභාවේ 'දෙමළ අධිකාරි' නමින් හැඳින් වූ විශේෂ තනතුරක් තිබිණි. ඔහුගේ කාර්යය වූයේ අනුරාධපුරය සහ ඒ අවට වාසය කළ දෙමළ ජනයාගේ ශුභසාධන කටයුතු සොයා බැලීම විය යුතු බව.
* ශ්‍රී පාදය මෙරට බෞද්ධ වැසියන්ගේ හා මුස්ලිම් බැතිමතුන්ගේ ද වන්දනාවට ලක් වූ බව (ආදම්ගේ කන්ද)
* ක්‍රිස්තු වර්ෂයේ 850 දී සුලෙයිමාන් නමැති දේශ ගවේෂකයකු මෙන් ම වෙළෙන්දෙකු වූ තැනැත්තෙකු ශ්‍රී පාදය වන්දනා කිරීමට පැමිණීම

06. i. A. පීඩන ගල්බණය B. බෙල්ලන් බැදි පැළැස්ස C. සකපෝරුව
ii. - පොළොව මත ගල් කැබලි අතුරා සවිමත් කොට ඒ මත මැටි අතුරා එම නිවාසේ ගෙබිම ඉදි කර තිබීම
- ඉදිරිපස සහ පිටුපස වශයෙන් කොටස් දෙකක් වෙන් කිරීමට නිවස මැදින් බිත්තියක් ඉදි කර තිබීම
- දුවමය දොර උළුවස්සක් සවි කර තිබීම
- අතිවාරමක් මත බිත්ති ගොඩ නගා ඒ මත වහලක් සවි කර කාලයක් පවතින ලෙස ඉදි කර තිබීම
- පන් ඉලුක් මනා ආදිය සෙවිළිකර වහළසකස් කර තිබීම
iii. - කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීම
- ගංවතුර පාලනය කිරීම
- නාගරික ජනතාවගේ වෙනත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම
iv. 10 ශ්‍රේණියේ පෙළපොත පිටු අංක 65 සිට 67 දක්වා තොරතුරු ඇසුරෙන්

07. i. රුවන්වැලිසෑය, මිරිසවැටිය, ජේතවනය, අභයගිරිය
ii. - සබරගමු පළාතට අයත් බලංගොඩ සමනළ වැව ප්‍රදේශය
- මධ්‍යම පළාතට අයත් සීගිරියට නුදුරු අලකොළ වැව දෙහිගහ ඇළ කන්ද ප්‍රදේශය
iii. බුදු දහම ජනතාව අතර ප්‍රචලිතව තිබුණ ද කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා එකල ජනතාව වෙනත් යාතු කර්මික පූජා වෙත ද නැඹුරු වී සිටියහ. විවිධ ප්‍රාදේශික දෙවිවරරු වෙනුවෙන් කරන පුද පූජා ඒ අතර ප්‍රධාන ය. ඒ හැරුණු විට එදිනෙදා ගැටලු විසඳා ගැනීමට කෙම්පහන ක්‍රම යනුවෙන් හැඳින්වෙන සරල විධි ක්‍රමයක් ද අනුගමනය කෙරිණි. මෙහි දී සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ මී තෙල් තලතෙල් ආදි කිසියම් තෙල් වර්ගයකින් පහනක් හෝ පහන් කිහිපයක් දල්වා කිසියම් පූජාවක් පැවැත් වීම යි. වගාවලට ඇති වන කෘමි උවදුරු වළක්වා ගැනීම හරකුන්ට වැළඳෙන ඇතැම් රෝග නිවාරණය කිරීමට අපේ පැරැන්නෝ කෙම්පහන් ක්‍රම අනුගමනය කළහ.



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



iv. * පරිසරය ආරක්ෂා කිරීමට (පස / ජලය / ගස් කොළන් / සතුන්)
කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය - නිසි කාලයට සී සෑම නොකරන පුද්ගලයින්ට කළං පහ ක දඩයක් නිමය කිරීම
අනුරාධපුර වෙස්සගිරිය සෙල් ලිපියක - වැව්වලින් ගොවිතැන් කරන කුඹුරුවල සිහිනැටි, වී, මිස, මුං ඇට වැපිරීම නොකළ යුතු බවයි. (හතර වන මහින්ද රජතුමා)
අමණ්ඩ ගාමිණී අභය රජු - 'මාඝාත නීතිය'
හතරවන මිහිඳු රජු - මහින්තලා පුවරු ලිපිය - මී හරකුන්, එළ හරකුන් සහ එළුවන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම පැන වීම
අනුරාධපුර පුවරු ලිපිය - උස් ගොඩ බිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බව
බුද්ධන්නෙහෙල - සෙල් ලිපිය - වල්වල දඬුපත් නොකපනු ඉසා

* බදු නීතිය
වැව් පරිපාලනය සහ රජයේ ඉඩම් පරිහරණය කිරීමට සම්බන්ධ බදු
(දකපති / බොජකපති / මතෙරමජිබක)
ගොඩවාය ලිපිය - වරාය තීරු බදු
වෙළෙපොළ පාලනය - හෝපිටිගම ලිපිය (හතරවන උදය රජතුමා)
- හෝපිටිගම වෙළෙඳපල සීමාවේ වෙළෙඳාම් කරන අයගෙන් පමණක් බදු අය කළ යුතු බව අතර වෙළෙඳපල පසුකොට යන්නවුන්ගෙන් බදු අය නොකළ යුතු බව
- නිලධාරීන්ට නොපෙන්වා එම වෙළෙඳපලේ භාණ්ඩ විකුණන අයගෙන් දෙගුණයක් බදු අය කළ යුතු බව
- රජයේ නිලධාරීන් විසින් ප්‍රමිතිගත නොකරන ලද මදටිය බර (තරාදි පඩි) යොදා වෙළෙඳාම් නොකළ යුතු බව
- බුලත් සහ පුවක් විකිණීම ඒ සඳහා සකස් කරන ලද මඩුවල පමණක් තබා වෙළෙඳාම් කළ යුතු බව
- පොහොය දිනවල වෙළෙඳාම් කළ අයගෙන් දඩයක් වශයෙන් තෙල් බද්දක් ලබා ගත යුතු බව

* අපරාධ නීතිය - වේවැල් කැටිය නීතිය
- හතරවන මිහිඳු රජු - මිහින්තලා පුවරු ලිපියේ - මී හරකුන්, එළ හරකුන් සහ එළුවන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම පැනවීම

* විහාර ආරාම පාලනය - මිහින්තලා පුරුව ලිපිය
උදාහරණ ඇසුරෙන් විස්තර කර තිබීම

08. i. භික්ෂූන් වහන්සේලා ධනවත් වෙළෙඳ ප්‍රධානීන්, නාවික කටයුතු යෙදුණු කප්පිත්තන්, වෛද්‍යවරුන්, ගුරුවරු
ii. - වැව් පරිපාලනය - රජයේ ඉඩම් පරිහරණය - වරාය බදු
iii. 10 පෙළ පොත 80 - 81 පිටු ඇසුරෙන්
iv. 10 පෙළ පොත 85 - 86 පිටුවල තොරතුරු ඇසුරෙන්

09. i. අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙණිය
ii. නියඟය, ගංවතුර, සතුන් අතර පැතිර යන වසංගත රෝග
iii. නැගෙනහිර වෙරළේ පිහිටි වරායවල් සක්‍රිය කිරීම
ඒ වරායවල් හරහා රට තුළට ඇදී එන ආදායම පාලනය කිරීම
ඒ ස්ථාන හරහා පැමිණෙන විවිධාකාර පුද්ගලයන්ගෙන් රටේ ආරක්ෂාව ඇති විය හැකි තර්ජන වළකා ගැනීම
iv. * දුර්වල පාලකයන් බලයට පත් වීම
* රාජ වංශ අතර ඇති වූ බල අරගල
* ආර්ථික පරිහාණිය
* කාලිංග මාඝ ආක්‍රමණය යන කරුණු අතරින් තුනක්

# 10 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 150



Rs : 150



Rs : 150



Rs : 150



Rs : 150



Rs : 200



Rs : 300



Rs : 350



Rs : 300



Rs : 300



Rs : 150



Rs : 200



Rs : 150



Rs : 300



Rs : 300



Rs : 300

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.



Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180


LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE